**ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර**

**Sri Sumangala College - Panadura**

**ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු**

**1st Term Test - March 2020**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / Grade: 11 | විෂයය / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / Paper: II | කාලය / Time: පැය 02 |

නම :- ........................................................................................ පංතිය :- ..........................

**සැලකිය යුතුයි :-**

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්න වලට ලකුණු 10 බැගින් හිමි වේ.

---

1) (i) "රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං" මෙම පාඨයේ අදහස ලියන්න.

(ii) බුදුරජාණන් වහන්සේ තම වසඟයට ගැනීමේ අරමුණින් පැමිණි මාර දූවරුන් තිදෙනාගෙන් දෙදෙනෙක් නම් කරන්න.

(iii) "සමග්ගා හෝථ මා විවදථ" යන පාඨයේ අදහස ලියන්න.

(iv) බුදුන්වහන්සේ ගිලනුන්නට උපස්ථාන කළ අවස්ථා 02ක් නම් කරන්න.

(v) බුදුදහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම 02 නම් කරන්න.

(vi) අංගුලිමාල දමනයෙන් ප්‍රකට වන බුද්ධ ගුණය ලියා දක්වන්න.

(vii) අනුරාධපුර යුගයට අයත් ජේතවනාරාමය හ ථූපාරාමය ඉදිකළ පාලකයන් දෙදෙනා කවුද?

(viii) පොළොන්නරු සාහිත්‍ය යුගයට අයත් බෞද්ධ සාහිත්‍ය කෘති 02ක් ලියන්න.

(ix) කණිෂ්ක සංගීතයෙහි (මහායාන 04 වන සංඝායනාව) ප්‍රතිඵල 02ක් ලියන්න.

(x) කොසඹෑ නුවර ඝෝසිථාරාමයේ භික්ෂූන්ගේ කළහකාරී හැසිරීමට මුල් වූ හේතුව ලියන්න.

(ල. 2 x 10 = 20)

2) (i) දස පාරමිතා ධර්මවලින් 02ක් නම් කරන්න. (ල. 2)

(ii) පාරමිතා ත්‍රිවිධාකාර වේ. නම් කරන්න. (ල. 3)

(iii) පාරමිතා ධර්ම පිරීමෙන් ලෞකික ජීවිතයට ඇති ප්‍රයෝජන නම් කරන්න. (ල. 5)

3) (i) “භාවේති කුසල ධම්මේ අසේවති වඩ්ඪේති ඒතායතාති භාවනා” යන්නෙහි අදහස ලියන්න. (ල. 2)

(ii) භාවනාවට පිවිසෙන තැනැත්තා තුළ තිබිය යුතු පූර්ව අවශ්‍යතා 05න් 03ක් ලියන්න. (ල. 3)

(iii) සමථ භාවනාවෙන් ශිෂ්‍ය ගෘහ ජීවිතයට ගත හැකි ප්‍රයෝජන සැකැවින් විස්තර කරන්න.

(ල. 6)

4) (i) බුදු සිරිතේ අභියෝගාත්මක සිදුවීම් 02ක් ලියන්න. (ල. 2)

(ii) ඔබ ජීවිතයේ මුහුණ දී අති අභියෝගතා 03ක් ලියන්න. (ල. 3)

(iii) අභියෝගතා වලට සාර්ථකව මුහුණ දීමට ඔබ තුළ වර්ධනය කරගත යුතු ගුණාංග 05ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

5) (i) විදර්ශනා භාවනාව හඳුන්වන වෙනත් නම් 02ක් ලියන්න. (ල. 2)

(ii) කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන මිද්ධ, යන නීවරණ ධර්ම තුනෙහි අර්ථය උපමා සහිතව පැහැදිලි කරන්න. (ල. 3)

(iii) මානසික අසහනයෙන් පිරුණු සමාජයකට භාවනාවෙන් ලැබෙන සහනය පෙන්වා දෙන්න. (ල. 5)

6) (i) බුදුරජාණන් වහන්සේ තුළ පැවති උත්තරීතර ගුණාංග 02ක් නම් කරන්න. (ල. 2)

(ii) භාරතීය සමාජය තුළ බුදු රජුන් ප්‍රශංසාවට ලක් කළ අන්‍යාගමික නායකයන් 03ක් නම් කරන්න. (ල. 3)

(iii) අෂ්ඨලෝක ධර්මය පිළිවෙලින් නම් කර උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

7) පහත සඳහන් මාතෘකා අතුරින් 02කට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) ස්ථූපය (ල. 5)

(ii) දුටුගැමුණු රජතුමා (ල. 5)

(iii) මාතලේ අළුවිහාර සංගායනාව (ල. 5)

(iii) සඳකඩ පහණ (ල. 5)